සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# 25 B - යුරෝපා ඉතිහාසය

## නව නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

## 25 B - යුරෝපා ඉතිහාසය (නව නිර්දේශය)

### ලකුණු බෙදී යාමේ ආකාරය

I පත්‍රය 01 x 40 = 40

II පත්‍රය

| | | |
|---|---|---|
| අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 12 |
| සෙසු ප්‍රශ්න 3කට 14 බැගින් | = | 48 |
| II පත්‍රය අවසාන ලකුණු | = | 60 |

අවසාන ලකුණු = 40 + 60 = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) .............................................................. √ $\frac{4}{5}$
..............................................................
..............................................................

(ii) .............................................................. √ $\frac{3}{5}$
..............................................................
..............................................................

(iii) .............................................................. √ $\frac{3}{5}$
..............................................................
..............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

AL/2020/25 B/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

යුරෝපා ඉතිහාසය II (I කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி I)
History of Europe II (Part I)

25 B S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

විභාග අංකය: ..................................

**උපදෙස්:**

- ※ මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- ※ මෙම කොටසට **ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- ※ කොටස් දෙකට ම මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස. II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) මර්මරා (2) ඊජියන් (3) ඇඩ්‍රියාතික් (4) ආර්ක්ටික් (5) බෝල්ටික් (.....4.....)

2. (1) ස්පාටා (2) කොරින්ත් (3) ඇතැන්ස් (4) මිලෙටස් (5) ගෝල් (.....5.....)

3. (1) ඇකඩෙමි (2) ලයිසියම් (3) කොලෝසියම් (4) ඔක්ස්ෆඩ් (5) කේම්බ්‍රිජ් (.....3.....)

4. (1) ටොලමි (2) වර්ජිල් (3) හොරස් (4) ඔවිඩ් (5) ජුවෙනල් (.....1.....)

5. (1) ටයිබීරියස් (2) ක්ලෝඩියස් (3) ට්‍රාජන් (4) මාකස් අවුරේලියස් (5) චාලිමේන් (.....5.....)

6. (1) ටියුඩර් (2) බූර්බන් (3) ස්ටුවර්ට් (4) හැනෝවර් (5) වින්ඩ්සර් (.....2.....)

7. (1) පළමුවන ජේම්ස් (2) පළමුවන චාල්ස් (3) ඔලිවර් ක්‍රොම්වෙල් (4) දෙවන චාල්ස් (5) දෙවන ජේම්ස් (.....3.....)

8. (1) චාල්ස් කැලෝන් (2) අබේ සියෙස් (3) මිරාබෝ (4) ජීන් පෝල් මරාත් (5) ජෝර්ජ් ජැක් ඩැන්ටන් (.....1.....)

[දෙවැනි පිටුව බලන්න.

**9.** (1) පළමුවන සාර් ඇලෙක්සැන්ඩර් (2) දහඅටවන ලුවී
(3) ක්ලෙමන්ස් ෆොන් මෙටර්නික් (4) කාසල්රී
(5) කාල් ෆොන් හාඩෙන්බර්ග් (...2...)

**10.** (1) අයිලා ෂැපෙල් සම්මේලනය (2) ට්‍රොපෝ සම්මේලනය (3) ලයිබැක් සම්මේලනය
(4) වෙරෝනා සම්මේලනය (5) බර්ලින් සම්මේලනය (...5...)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද එකිනෙකට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) පෙලපොනීසියානු යුද්ධය - ඇතැන්ස් සහ ස්පාටා
(2) පියුනික් යුද්ධ - රෝමය සහ කාර්තේජය
(3) කුරුස යුද්ධ - ප්‍රංශය සහ එංගලන්තය
(4) ක්‍රිමියන් යුද්ධය - රුසියාවට එරෙහිව එංගලන්තය සහ ප්‍රංශය
(5) සත් සති යුද්ධය - ඔස්ට්‍රියාව හා ප්‍රශියාව (...3...)

**12.** (1) ජුපිටර් - ආකාශයට අධිපති දෙවියා
(2) මාර්ස් - හිරු දෙවියා
(3) මිනෙර්වා - ප්‍රඥාවට හා ශිල්පකලාවන්ට අධිපති දෙවඟන
(4) වීනස් - ප්‍රේමයට අධිපති දෙවඟන
(5) නෙප්චූන් - මුහුදට අධිපති දෙවියා (...2...)

**13.** (1) ලිවි - රෝමයේ ඉතිහාසය
(2) ටැසිටස් - ඉතිහාසය (Histories)
(3) ශාන්ත ඔගස්ටීන් - දෙවියන්ගේ නගරය (City of God)
(4) ශාන්ත තෝමස් ඇක්වයිනාස් - සුම්මා තියොලොජිකා
(5) තොමස් හොබ්ස් - කුමාරයා (...5...)

**14.** (1) වැලෝයි - පාදුවා
(2) ස්ෆෝර්සා - මිලාන්
(3) මෙඩිචි - ෆ්ලොරන්ස්
(4) එස්තෙ - ෆෙරාරා
(5) ගොන්සාගා - මැන්ටුවා (...1...)

**15.** (1) උත්කෘෂ්ට විප්ලවය - පාර්ලිමේන්තුව ජයග්‍රහණය කිරීම
(2) අමෙරිකන් විප්ලවය - අයිතිවාසිකම් පනත
(3) ප්‍රංශ විප්ලවය - මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනය
(4) ජාතීන්ගේ සංගමය - මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය
(5) රුසියන් විප්ලවය - නිර්ධන පන්තික ආඥාදායකත්වය (...4...)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) ප්ලේටෝ | A "කුමාරයා, සිංහයා සහ හිවලා අනුකරණය කළ යුතු ය." |
| (ii) යේසුස් ක්‍රිස්තුස් වහන්සේ | B "මිනිසා නිදහස්ව උපත ලබා ඇති නමුත් ඔහු සෑම තැනම යදමින් බැඳදමා ඇත." |
| (iii) මකියාවෙලී | C "සියලු රටවල කම්කරුවනි, එක්වන්න!" |
| (iv) රූසෝ | D "දාර්ශනිකයෝ රජවරුන් විය යුත්තාහ." |
| (v) කාල් මාක්ස් | E "සීසර්ට ලැබිය යුතු දේ සීසර්ටත්, දෙවියන් වහන්සේට ලැබිය යුතු දේ දෙවියන් වහන්සේටත් ලබා දෙන්න." |

(1) ABECD (2) AEDCB (3) BAECD (4) DEABC (5) DEBAC (...4...)

[තුන්වැනි පිටුව බලන්න.

17.

| | X | | Y |
|---|---|---|---|
| (i) | මයිකලාංජලෝ | A | අමෙරිකන් විප්ලවය |
| (ii) | මාටින් ලූතර් | B | උපයෝගිතාවාදය |
| (iii) | වෝල්ටෙයාර් | C | ආගමික ප්‍රතිසංස්කරණය |
| (iv) | ජෝර්ජ් වොෂිංටන් | D | ඉතාලි පුනරුදය |
| (v) | ජෙරමි බෙන්තම් | E | ප්‍රබුද්ධවාදය |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EACDB (5) ECADB (…1…)

18.

| | X | | Y |
|---|---|---|---|
| (i) | නිකොලස් කොපර්නිකස් | A | ජර්මන් |
| (ii) | ජොහැන්නස් කෙප්ලර් | B | පෝලන්ත |
| (iii) | ගැලිලියෝ ගැලිලී | C | ස්පාඤ්ඤ |
| (iv) | මයිකල් සර්වේටස් | D | ඉංග්‍රීසි |
| (v) | විලියම් හාවේ | E | ඉතාලි |

(1) ABDEC (2) BADEC (3) BAECD (4) BEACD (5) CDAEB (…3…)

19.

| | X | | Y |
|---|---|---|---|
| (i) | වර්සායි ගිවිසුම | A | ඔස්ට්‍රියාව |
| (ii) | ශාන්ත ජර්මේන් ගිවිසුම | B | හංගේරියාව |
| (iii) | නියුලි ගිවිසුම | C | තුර්කිය |
| (iv) | ට්‍රියනොන් ගිවිසුම | D | බල්ගේරියාව |
| (v) | ලොසෑන් ගිවිසුම | E | ජර්මනිය |

(1) ACEBD (2) AEDBC (3) DECAB (4) EADBC (5) EDACB (…4…)

20.

| | X | | Y |
|---|---|---|---|
| (i) | මාර්ෂල් ටිටෝ | A | ප්‍රංශයේ හතරවන සමූහාණ්ඩුවේ ප්‍රථම ජනාධිපති |
| (ii) | චාල්ස් ඩි ගෝල් | B | දෙවන ලෝක යුද්ධයෙන් පසු බ්‍රිතාන්‍යයේ ප්‍රථම අගමැති |
| (iii) | ක්ලෙමන්ට් ඇට්ලී | C | යුගෝස්ලාවියාවේ ජනාධිපති |
| (iv) | ට්‍රිග්වි ලී | D | බ්‍රිතාන්‍යයේ ප්‍රථම කාන්තා අගමැතිනිය |
| (v) | මාගරට් තැචර් | E | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම මහලේකම් |

(1) BAECD (2) CABED (3) CEABD (4) DECBA (5) EDABC (…2…)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

21. **පුරාණ රෝමයේ දේශපාලනය**

(1) රෝමය ලතින් පෞර රාජ්‍යයක් ලෙස ආරම්භ විය.
(2) රෝමය මුල දී රාජාණ්ඩුවක් මගින් පාලනය කෙරිණි.
(3) ක්‍රි.පූ. හයවැනි සියවස අවසානයේ දී රෝමය සමූහාණ්ඩුවක් බවට පත් විය.
(4) ප්ලේටෝගේ දර්ශනය රෝම දේශපාලනය සම්බන්ධයෙන් විශාල බලපෑමක් ඇති කළේ ය.
(5) ඔගස්ටස් යටතේ රෝමය අධිරාජ්‍යයක් බවට පත් විය. (…4…)

22. **පුනරුදය**

(1) පුනරුදය ඉතාලියේ ආරම්භ විය.
(2) පුනරුදය, ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ සෘජු ප්‍රතිඵලයක් විය.
(3) පුනරුදය යුරෝපයේ නූතනත්වයේ උපත සලකුණු කරයි.
(4) පුනරුදයේ කැපී පෙනෙන කාර්යසාඵල්‍යයන් කලා ක්ෂේත්‍රය තුළ දැකිය හැකි ය.
(5) පුනරුදය, පසුව, ජර්මනියට, ප්‍රංශයට, එංගලන්තයට හා ස්පාඤ්ඤයට ව්‍යාප්ත විය. (…2…)

[හතරවැනි පිටුව බලන්න.

**23. තිස් අවුරුදු යුද්ධය**

(1) තිස් අවුරුදු යුද්ධය ඇති වූ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ ජර්මනියයි.
(2) තිස් අවුරුදු යුද්ධය කතෝලිකයන් හා ප්‍රොතෙස්තන්තවාදීන් අතර ඇති විය.
(3) තිස් අවුරුදු යුද්ධය, ශුද්ධ රෝම අධිරාජ්‍යය ජයග්‍රහණය කරමින් අවසන් විය.
(4) වෙස්ට්ෆේලියා සාම ගිවිසුමෙන් සාමය යළි ස්ථාපිත කරන ලදී.
(5) තිස් අවුරුදු යුද්ධය, යුරෝපයේ ඇති වූ අවසාන ආගමික යුද්ධය විය. (...3...)

**24. ප්‍රංශ විප්ලවය**

(1) ප්‍රාග් විප්ලවීය ප්‍රංශ සමාජය ප්‍රජා ගණ තුනකට බෙදී පැවතුණි.
(2) මූල්‍ය අර්බුදය ප්‍රංශ විප්ලවය ඇතිවීමට තුඩුදුන් ආසන්නතම හේතුව විය.
(3) ප්‍රංශ විප්ලවයේ ආරම්භය සලකුණු කරමින් බැස්ටීලය බිඳ හෙලන ලදී.
(4) ප්‍රංශ විප්ලව සමයේ දී දහසයවන ලුවී රජතුමා මරණීය දණ්ඩනයට ලක් කෙරිණි.
(5) දාහත්වන ලුවී රජතුමා දාසයවන ලුවී රජුගෙන් පසු රජකමට පත් විය. (...5...)

**25. ඉතාලිය එක්සත් කිරීම**

(1) වියනා සම්මුතියෙන් ඉතාලිය රාජ්‍ය කොටස් ගණනාවකට බෙදන ලදී.
(2) 1815 සිට 1848 දක්වා ඉතාලිය එක්සත් කිරීම සඳහා අසාර්ථක ප්‍රයත්න කීපයක්ම දරනු ලැබී ය.
(3) පාප් වහන්සේගේ ආශිර්වාදය ඇතිව ඉතාලිය එක්සත් කරනු ලැබී ය.
(4) සාර්ඩිනියා-පීඩ්මොන්ට් රාජ්‍යයේ නායකත්වය යටතේ ඉතාලිය එක්සත් කරන ලදී.
(5) කැවුර්, ඉතාලි එක්සත් භාවයේ ප්‍රධාන නිර්මාපකයා විය. (...3...)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ 1 ද
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ 2 ද
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ 3 ද
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ 4 ද
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ........ 5 ද වරහන තුළ ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. ජාතික රාජ්‍ය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) පහළොස්වන හා දාසයවන සියවස්වල දී ස්පාඤ්ඤයේ, එංගලන්තයේ හා ප්‍රංශයේ ජාතික රාජ්‍ය වර්ධනය විය.
(B) ශක්තිමත් ස්ථාවර හමුදාව, ජාතික රාජ්‍යවල එක් අංගයක් විය.
(C) ජාතික රාජ්‍ය තුළ රජුගේ බලතල සීමා කොට තිබුණි.
(D) වැඩවසම් රදළ අධිපතීහු පරිපාලන ක්ෂේත්‍රය තුළ බලවත් පිරිසක් ලෙස කටයුතු කළහ. (...1...)

**27. එංගලන්තයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ස්ටුවට් රජවරු පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමට පියවර ගත්හ.
(B) 1832 ප්‍රතිසංස්කරණ පනතින් සාමි මන්ත්‍රී මණ්ඩලයේ බලතල අඩු කෙරිණි.
(C) දහනවවන හා විසිවන සියවස්වල දී මනාව සංවිධානය වූ දේශපාලන පක්ෂ ක්‍රමයක් වර්ධනය විය.
(D) 1928 දී වයස අවුරුදු 21 ට වැඩි ගැහැණු හා පිරිමි සියල්ලටම ඡන්ද බලය පිරිනමන ලදී. (...4...)

[පස්වැනි පිටුව බලන්න.

28. ඇමෙරිකන් විප්ලවය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ඇමෙරිකන් විප්ලවය, කිසියම් විදේශීය යටත් විජිතයක් යුරෝපීය අධිරාජ්‍ය බලවතෙකුට එරෙහිව සටන් කොට ජයගත් පළමු අවස්ථාව සලකුණු කරයි.

(B) බ්‍රිතාන්‍ය පාලකයන් විසින් පනවන ලද බදු ඇමෙරිකන් විප්ලවය ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන හේතුවක් විය.

(C) ප්‍රංශයෝ, ඇමෙරිකානුවන්ට එරෙහිව බ්‍රිතාන්‍යයන්ට ආධාර දුන්හ.

(D) 1776 ජූලි 4 දා ස්වාධීනතා ප්‍රකාශනය නිල වශයෙන් සම්මත කරන ලදී. (...5...)

29. පළමුවන ලෝක යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) පළමුවන ලෝක යුද්ධය ඇතිවන විට බිස්මාර්ක් ජර්මනියේ චාන්සලර්වරයා විය.

(B) පළමුවන ලෝක යුද්ධය ආරම්භයේ ඉතාලිය, ජර්මනිය සමඟ එකතු විය.

(C) ඔස්ට්‍රියාවේ ප්‍රැන්සිස් ෆර්ඩිනාන්ඩ් සරයේවෝහි දී ඝාතනය කිරීම පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් ආසන්නතම හේතුව විය.

(D) වර්සායි ගිවිසුම අත්සන් තැබීමෙන් පළමුවන ලෝක යුද්ධය අවසන් විය. (...4...)

30. දෙවන ලෝක යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ජර්මනිය, ඉතාලිය හා ජපානය අක්ෂ බලවතුන් ලෙස හැඳින්විණ.

(B) ජර්මානුවන් විසින් ලුසිටානියා නැව ගිල්වා දැමීම, ඇමෙරිකාව දෙවන ලෝක යුද්ධයට ඇතුළුවීමට මඟ පෑදී ය.

(C) හිරෝෂිමා හා නාගසාකි මත න්‍යෂ්ටික බෝම්බ හෙළීමෙන් දෙවන ලෝක යුද්ධය අවසන් විය.

(D) දෙවන ලෝක යුද්ධයෙන් පසු ජාතීන්ගේ සංගමය පිහිටුවන ලදී. (...2...)

- අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

31. නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර කුමක් ද?

(1) රෝමය (2) ඇලෙක්සැන්ඩ්‍රියාව (3) ජෙරුසලම
(4) කොන්ස්තන්තිනෝපලය (5) ඩැමස්කස් (...4...)

32. වීනස්ගේ උපත (Birth of Venus) නම් චිත්‍රය සිතුවම් කළ සුප්‍රසිද්ධ චිත්‍ර ශිල්පියා කවුද?

(1) මසච්චියෝ (2) සාන්ද්‍රෝ බොටිචෙලී
(3) ලෙනාර්ඩෝ ඩා වින්චි (4) ටිටියන්
(5) රෆායල් (...2...)

33. ඉතාලිය එක්සත් කරන විට සාර්ඩිනියාවේ රජ කළ පාලකයා කවුද?

(1) දහවන චාල්ස් (2) ලුවී පිලිප් (3) චාල්ස් ඇල්බට්
(4) දෙවන වික්ටර් එමැනුවල් (5) පළමුවන විලියම් (...4...)

34. සාපේක්ෂතාවාදය පිළිබඳ න්‍යාය ඉදිරිපත් කළේ කවුද?

(1) ලුවී පාස්චර් (2) මාරි කියුරි (3) චාල්ස් ඩාවින්
(4) සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් (5) ඇල්බට් අයින්ස්ටයින් (...5...)

35. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පළමුවන ආසියාතික මහලේකම්වරයා කවුද?

(1) යු තාන්ට් (2) නෙ වින්
(3) කුර්ට් වෝල්ඩ්හයිම් (4) මොරාජි දේසායි
(5) පෙරේස් ඩි කුවෙලාර් (...1...)

[ හයවෙනි පිටුව බලන්න.

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | රෝම අධිරාජ්‍යයේ උතුරු දේශසීමාවලින් ඔබ්බෙහි ජීවත් වූ ජර්මන් ගෝත්‍ර ම්ලේච්ඡයන් ලෙස හඳුන්වන ලදී. | ම්ලේච්ඡ ආක්‍රමණ බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීමට තුඩුදුන් ප්‍රධාන සාධකය විය. | (...2...) |
| **37.** | පහළොස්වන හා දාසයවන සියවස්වල දී යුරෝපයේ ආර්ථික ක්ෂෙත්‍රය තුළ මූලික පරිවර්තනයක් දැකිය හැකි ය. | යුරෝපයේ නූතන යුගයේ ආරම්භයේ දී වෙළෙඳාම විශාල වශයෙන් පුළුල් වූ අතර මධ්‍යතන ආර්ථික සංවිධානයේ අංග බොහෝමයක් වෙනුවට ධනවාදය වර්ධනය විය. | (...5...) |
| **38.** | අටවන හෙන්රි රජතුමා එංගලන්ත පල්ලියේ ප්‍රධානියා ලෙස තමන්ම පත් වී, තමන්ගේ එම ක්‍රියාව පාර්ලිමේන්තුව ලවා අනුමත කර ගත්තේ ය. | එස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම, අමෙරිකන් විප්ලවය ඇතිවීමට මඟ පෑදී ය. | (...1...) |
| **39.** | 1789 සිට 1848 දක්වා වූ විප්ලවීය සමය තුළ චාර්ටිස්ට් ව්‍යාපාරය ප්‍රංශයේ වර්ධනය විය. | 1848 දී ලුවී නැපෝලියන් ප්‍රංශයේ දෙවන සමූහාණ්ඩුවේ ජනාධිපතිවරයා බවට පත් විය. | (...4...) |
| **40.** | ලෙනින් විසින් ආරම්භ කරන ලද නව ආර්ථික ප්‍රතිපත්තිය ජෝශප් ස්ටාලින් අඛණ්ඩව ක්‍රියාත්මක කළේ ය. | ජෝශප් ස්ටාලින්ගේ විදේශ ප්‍රතිපත්තිය, බටහිර ජාතීන් සමඟ සාමකාමී සහජීවනය අරමුණු කරගෙන පැවතුණි. | (...3...) |

* *

[ හත්වෙනි පිටුව බලන්න.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020**

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம

විෂයය අංකය / பாட இலக்கம்: **25 B**

විෂයය / பாடம்: **යුරෝපා ඉතිහාසය**

**ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்**
**I පත්‍රය/பத்திரம் I**

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 4 | 31. | 4 |
| 02. | 5 | 12. | 2 | 22. | 2 | 32. | 2 |
| 03. | 3 | 13. | 5 | 23. | 3 | 33. | 4 |
| 04. | 1 | 14. | 1 | 24. | 5 | 34. | 5 |
| 05. | 5 | 15. | 4 | 25. | 3 | 35. | 1 |
| 06. | 2 | 16. | 4 | 26. | 1 | 36. | 2 |
| 07. | 3 | 17. | 1 | 27. | 4 | 37. | 5 |
| 08. | 1 | 18. | 3 | 28. | 5 | 38. | 1 |
| 09. | 2 | 19. | 4 | 29. | 4 | 39. | 4 |
| 10. | 5 | 20. | 2 | 30. | 2 | 40. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :
එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்
**මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 × 40 = 40**

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) පිරනීස් කඳුවැටිය
(ii) කළු මුහුද
(iii) කොන්ස්තන්තිනෝපල්
(iv) සේන් ගඟ
(v) ලන්ඩන්
(vi) බෝල්ටික් මුහුද
(vii) ඉංග්‍රීසි ඕඩය
(viii) රයින් ගඟ
(ix) ලිස්බන්
(x) ස්විට්සර්ලන්තය
(xi) ස්වීඩන්
(xii) කෝසිකා

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| | | | |
|---|---|---|---|
| යුරෝපා ඉතිහාසය II<br>ஐரோப்பிய வரலாறு II<br>History of Europe II | | 25B | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 1

විභාග අංකය / சுட்டெண் / Index No. } ..............................



## B කොටස

2. පහත දැක්වෙන ක්ෂේත්‍ර ඇසුරෙන් පැරණි ග්‍රීක සංස්කෘතියේ කැපී පෙනෙන ලක්ෂණ පරීක්ෂා කරන්න.

(i) ආණ්ඩුක්‍රම

(ii) ආගම

(iii) සාහිත්‍යය

(i) ආණ්ඩුක්‍රම

❖ පුරාණ ග්‍රීකයන්ගේ දේශපාලන සමාජය, පෞර රාජ්‍ය මත පදනම්ව පැවතීම; එම රාජ්‍ය විශාල සංඛ්‍යාවක් පැවතීම: ඇතන්ස්, ස්පාටා, තීබ්ස්, මෙගාරා, කොරින්ත්, ආර්ගෝස්, මිලෙටස්, මයිටිලීන්, සමෝස් ඒ අතරින් වඩාත් ප්‍රකට කීපයකි.

❖ මෙම පෞර රාජ්‍ය බොහොමයක් තුළ බොහෝදුරට එක හා සමාන ආණ්ඩුක්‍රම විකාශයක් සිදු වූ අතර ඒවායේ විවිධ ආණ්ඩුක්‍රම පැවතීම.

- රාජාණ්ඩුව: මුල්ම ආණ්ඩුක්‍රම විශේෂයයි. රජු දෙවියන්ගෙන් පැවත ආවේ යයි විශ්වාස කරන ලද අතර ඔහුට විවිධ වරප්‍රසාද හා ගෞරව පවරා දී තිබීම; රජු ප්‍රධාන පූජකයා, ප්‍රධාන විනිශ්චයකාරයා හා හමුදා නායකයා වශයෙන් සැලකීම; ක්‍රි.පූ. 8 වැනි සියවසේදී පමණ මෙම ක්‍රමය පරිහානියට පත්වීම.

- ප්‍රභූතන්ත්‍රය: රාජාණ්ඩුව පරිහානියත් සමග මෙම ක්‍රමය නැඟී ඒම; ඇරිස්ටෝටල් පෙන්වා දී ඇති අන්දමට මෙම ක්‍රමයේදී ප්‍රභූවරුන්ගෙන් යුත් ස්ථාවර සභාව විසින් පාලන කටයුතු ගෙනයාම; වරප්‍රසාදලත් හා ධනවත් ප්‍රභූන් පිරිසක් වෙත පාලන බලය කේන්ද්‍රගත වීම; ආගමික රාජකාරි ඇතුළුව පරිපාලන කටයුතු තෝරාගත් ප්‍රභූන් පිරිසක් විසින් ගෙනයාම.

- කතිපයාධිපති ආණ්ඩුව: ධනවත් සුළු පිරිසක් තම යහපත සඳහා ගෙන ගිය මේ පාලන ක්‍රමය ප්‍රභූතන්ත්‍ර පාලනයට පසු බිහිවිය; ඉඩම් හිමිකම හා සියලු අයිතිවාසිකම්, මේ පාලකයන් සුළුතරයට හිමිවීම සහ ප්‍රජාපීඩක ආණ්ඩුක්‍රමයක් වීම.

  (ස්පාටාවේ මෙම ක්‍රමය පැවතියේ යයි සැලකේ - -රජවරුන් දෙදෙනෙක්, ජෙරූසියා හෙවත් වැඩිහිටියන්ගේ සභාව, අපෙලා හෙවත් සම සභාව යන ආයතන පැවති නමුත් ඉහළම අධිකාරය පැවතියේත් රාජ්‍ය පාලනය මුළුමනින්ම පාහේ ගෙනගියේත් පස්දෙනෙකුගෙන් යුත් එෆොරේට් නම් ආයතනය මගිනි.)

- ප්‍රජාපීඩක පාලනය: කතිපයාධිපති පාලනය යටතේ දැඩි පීඩාවට පත් ජනකොටස්වල ආධාරයෙන් බලයට පත් ප්‍රජාපීඩකයන්/ඒකාධිපතීන් විසින් කුලී හමුදාවල ආධාරයෙන් පාලනය ගෙන යන ලදී.

- ප්‍රජාතන්ත්‍රවාදය: ප්‍රජාපීඩක පාලන ක්‍රමය පෙරළා දමා මෙම ක්‍රමය බිහිවීම; මූලික වශයෙන් 'පුරවැසියන්ගේ' සමානාත්මතාව පදනම් කරගත් ක්‍රමයක් වීම.
  ඇතැන්ස් රාජ්‍යයේ මෙම ක්‍රමය මැනවින් ක්‍රියාත්මක වීම - එම පාලනය පෙරික්ලීස්ගේ සමයේදී පරිණතභාවයට පත්වී යයි සැලකේ. ආණ්ඩුක්‍රම ව්‍යුහය- (a) එක්ලීෂියා හෙවත් මහසභාව: සියලු වැඩිහිටි පුරවැසියන් සහභාගී වූ මේ සභාව රාජ්‍යයට සම්බන්ධ සියලු තීරණ ඡන්දයෙන් ගැනීම, (b) බව්ලේ හෙවත් පන්සිය දෙනාගේ සභාව එක්ලීෂියාවේ තීරණ ක්‍රියාත්මක කළ ආයතනය වීම (ගොඩනැගිලි තැනීම, විදේශ සම්බන්ධතා පවතාවාගෙන යාම ආදිය), (c) විධායක නිලධාරීන්; ඇතන්ස්හි පැවති ප්‍රජාතන්ත්‍රවාදය පුරවැසියන් පමණක් පාලනයට සහභාගී වූ 'ඍජු ප්‍රජාතන්ත්‍රවාදයක්' වීම.

**(ii)** ආගම

- ස්වභාවික වස්තූන්ට දේවත්වය ආරූඪකොට වැඳුම්පිදුම් කිරීම. එහෙත් ග්‍රීකයන් තුළ දෙවියන් කෙරෙහි පැවති බිය අනෙකුත් ශිෂ්ටාචාරවලට සාපේක්ෂව අඩුබව දක්නට ලැබීම.
  නිදසුන්: දෙවියන්ට මනුෂ්‍ය ස්වරූපය හා ගති පැවතුම් ආරූඪ කර තිබීම.
- දේව පරපුරක් පිළිබඳ විශ්වාස කිරීම - සියුස් (ආකාශ දෙවියා) ප්‍රධාන කොටගත් දේව මණ්ඩලය.
- බහුදේවවාදයක් පැවතීම.
- ග්‍රීක ආගම නිදහස් චින්තනයට බාධාකාරී නොවීම.
- විවිධ කලාවන්ගේ දියුණුවට ආගමෙන් අනුබල ලැබීම.
- ග්‍රීකයන් අතර එක්තරා දුරකට ආගමික එක්සත්භාවයක් දක්නට ලැබීම.

**(ii)** සාහිත්‍යය

❖ ග්‍රීක සාහිත්‍යය අංග කීපයකින් සමන්විත වීම:

- වීර කාව්‍ය - හෝමර්ගේ ඉලියඩ් හා ඔඩිසි
- ගී කාව්‍ය - පින්ඩාර්ගේ හා සැෆෝගේ නිර්මාණ
- නාට්‍ය - ශෝකාන්ත හා සුඛාන්ත (ප්‍රහසන ඇතුළුව)
  ශෝකාන්ත: ඊස්කිලස්ගේ, සොෆොක්ලීස්ගේ හා යුරිපිඩීස්ගේ නිර්මාණ
  සුඛාන්ත: ඇරිස්ටොෆනීස්ගේ නිර්මාණ
- ඉතිහාස කෘති - හෙරඩෝටස්ගේ හා තුසිඩිඩීස්ගේ රචනා, හෙසියඩ්ගේ 'වැඩ හා දවස්'.

*(ලකුණු 16යි)*

3. "දේශ ගවේෂණ ඇතිවීමට විවිධ ආර්ථික, දේශපාලන හා ආගමික සාධක ගණනාවක් හේතු විය."

**(i) මුල්කාලීන මුහුදු යාත්‍රික ගවේෂණවලට අනුග්‍රහ දැක් වූ පෘතුගීසි කුමාරයා නම් කරන්න.**

නාවික හෙන්රි

*(ලකුණු 01යි)*

**(ii) මුල්කාලීන ගවේෂණවල නිරත වූ <u>එක්</u> පෘතුගීසි ගවේෂකයෙකු හා <u>එක්</u> ස්පාඤ්ඤ ගවේෂකයෙකු නම් කරන්න.**

- පෘතුගාලය-ලෝපෝ ගොන්සාල්වේස්, බර්තොලමියු ඩයස්, වස්කො ද ගාමා, කබ්රාල්
- ස්පාඤ්ඤය- ක්‍රිස්ටෝෆර් කොළම්බස්, අමෙරිගෝ වෙස්පුචි, ෆර්ඩිනන්ඩ් මැගලන්, හර්නැන්ඩෝ කෝර්ටීස්, ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ

*(ලකුණු 02යි)*

**(iii) පෘතුගාලය හෝ ස්පාඤ්ඤය හෝ නිතර වූ ගවේෂණ සැකෙවින් දක්වන්න.**

- පෘතුගාලය
  - ලෝපෝ ගොන්සාල්වේස්
  - බර්තොලමියු ඩයස් - අප්‍රිකාවේ දකුණු තුඩුව දක්වා යාත්‍රා කිරීම
  - වස්කො ද ගාමා - ඉන්දියාවේ කැලිකට්වෙත පැමිණීම
  - කබ්රාල් - බ්‍රසීලය සොයාගැනීම
- ස්පාඤ්ඤය
  - ක්‍රිස්ටෝෆර් කොළම්බස් - කැරිබියන් දූපත්වලට ගොඩබැසීම
  - අමෙරිගෝ වෙස්පුචි - අමෙරිකා මහද්වීපයට ගොඩ බැසීම
  - වස්කෝ ද බැල්බෝවා - පැනමාව තරනය කොට පැසිෆික් සාගරය වෙත ළඟාවීම
  - ෆර්ඩිනන්ඩ් මැගලන් - පිලිපීන දූපත්වලට ගොඩබැසීම හා ලොව වටා යාත්‍රා කිරීම
  - හර්නැන්ඩෝ කෝර්ටීස් - මෙක්සිකෝව ජයගැනීම
  - ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ - පේරු දේශය ජයගැනීම

*(ලකුණු 04යි)*

**(iv) දේශ ගවේෂණ ඇතිවීමට විවිධ ආර්ථික, දේශපාලන හා ආගමික සාධක තුඩුදුන් ආකාරය පරීක්ෂා කරන්න**

- ආර්ථික - 1453 කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අතට පත්වීමෙන් පසුව පෙරදිග සිට යුරෝපයට වැටී තිබුණු වෙළඳ මාර්ග අවහිරවීම නිසා හටගත් වෙළඳ අර්බුදයට විසඳුමක් සෙවීම. ආසියාතික වෙළඳ ද්‍රව්‍ය යුරෝපයට ගෙනැවිත් අලෙවිකොට ලාබ ලබාගැනීමේ අපේක්ෂාව හා ඒ සඳහා වෙළඳ මාර්ගයක් සොයාගැනීමට පෙළඹීම.

❖ **දේශපාලන** - ජාතික රාජ්‍යවල නැගීමට සමගාමීව එකී රාජ්‍යවල පාලකයන්ගේ අනුග්‍රහය ලැබීම (ස්පාඤ්ඤයෙ ෆර්ඩිනන්ඩ් සහ ඉසබෙලා) සහ ජාතික රාජ්‍ය අතර හටගත් තරඟය.

❖ ආගමික - මුස්ලිම් ආධිපත්‍යය මර්දනය කිරීම හා කතෝලික දහම ප්‍රචලිත කිරීම.

මීට අමතරව වෙනත් කරුණු යනුවෙන් විද්‍යාත්මක දැනුම පුළුල්වීම (උතුරුතරු මාපකය, දුරදක්නය) හා ත්‍රාසජනක අත්දැකීම් ලැබීම කෙරෙහි වූ උනන්දුව යන කරුණුද සඳහන් කර තිබිය හැකියි.

*(ලකුණු 09 යි)*

4. **(i) කාර්මික විප්ලවය මුලින්ම එංගලන්තයේ ඇති වීමට තුඩු දුන් සාධක පරීක්ෂා කරන්න.**

❖ එංගලන්තයේ විදේශ වෙළඳාම පුළුල් වී යාම.
❖ භාණ්ඩ ඉල්ලුම වැඩි වීම හා නිෂ්පාදනය පුළුල් කර ගැනීමේ අවශ්‍යතාව මතුවීම.
❖ එංගලන්තය තුළ විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය හා දැනුම වර්ධනය වී තිබීම.
❖ වෙළඳාම වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මූලධනයක් උපයාගෙන සිටි ධනවතුන් පිරිසක් බිහිවී සිටීම.
❖ කෘෂිකාර්මික විප්ලවය (දෙවැනි ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය) නිසා ඉඩම් අහිමි හා රැකියා විරහිත පිරිසක් බිහිවී සිටීම හා ඔවුන් රැකියා සොයා නගරවලට සංක්‍රමණය වීම.
❖ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි වීම.

*(ලකුණු 06යි)*

**(ii) කාර්මික විප්ලවයෙන් උද්ගත වූ ප්‍රධාන තාක්ෂණවිද්‍යාමය, ආර්ථික හා සමාජ ප්‍රතිඵල සාකච්ඡා කරන්න.**

❖ **තාක්ෂණවිද්‍යාමය**
- දුවන නඩාව (ජෝන් කේ)
- ස්පිනිං ජෙනිය (ජේම්ස් හාග්‍රීව්ස්)
- ජලරාමුව (රිචඩ් ආක්රයිට්)
- ස්පිනිං මියුල් (සැමුවෙල් ක්‍රොම්ප්ටන්)
- පවර්ලූම් (එඩ්මන්ඩ් කාර්ට්රයිට්)
- වාෂ්ප ඇන්ජිම (තොමස් නිව්කොමන් හා ජේම්ස් වොට්)
- ආරක්ෂක ලාම්පුව (හම්ප්‍රි ඩේවි)
- දුම් බෝට්ටුව (රොබට් පුල්ටන්)
- දුම්රිය ඇන්ජිම (ජෝර්ජ් ස්ටීවන්සන්) ආදී නවෝත්පාදන බිහිවීම

❖ ආර්ථික

- නිෂ්පාදන මාර්ගවල මූලික පරිවර්තනයක් ඇතිවීම.
- කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථිකයක් වෙනුවට කර්මාන්ත පදනම් කොටගත් ආර්ථිකයක් බිහිවීම.

❖ සමාජ

- කාර්මික ධනහිමි හා කම්කරු යනුවෙන් නව සමාජ පන්ති බිහිවීම.
- ජනගහණ ව්‍යාප්තියේ වෙනසක් ඇතිවීම.
- මුල් යුගයේ කම්කරුවන්ට අතිශය අයහපත් තත්ත්වයන් යටතේ සේවය කිරීමට සිදුවීම හා ඉතාමත් දුක්ඛිත ජීවිත ගතකිරීමට සිදුවීම.
- පරිසර දූෂණය.

*(ලකුණු 10යි)*

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) රෝම අධිරාජ්‍යය තුළ ක්‍රිස්තියානිය ජයග්‍රහණය කිරීම

(ii) ප්‍රති රෙපරමාදුව

(iii) දාහතරවන ලුවී රජතුමා

(iv) එංගලන්තයේ සිදු වූ උත්කෘෂ්ට විප්ලවය

(i) රෝම අධිරාජ්‍යය තුළ ක්‍රිස්තියානිය ජයග්‍රහණය කිරීම

❖ යේසුස් වහන්සේ ජුදායි ප්‍රදේශයේ බෙත්ලෙහෙම්හි යුදෙව්වෙකු ලෙස ක්‍රි.ව. 1 වර්ෂයට ආසන්න වර්ෂයකදී උපත ලැබූ යේසුස් වහන්සේ තරුණ වියේදී නව ධර්මයක් දේශනා කිරීමට පටන්ගැනීම.

❖ එවකට පලස්තීනයේ ප්‍රචලිතව පැවති යුදෙව් ආගමේ තිබූ 'ගැලවුම්කරු' යන සංකල්පයට අනුව, ඇතැමුන් මෙතුමා එම ගැලවුම්කරු ලෙස සැලකීම.

❖ රෝම අධිකාරීන් ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ ඇණගසා මරණයට පත් කළ නමුත් කිතු දහම ක්‍රමයෙන් රෝම අධිරාජ්‍යය තුළ ව්‍යාප්ත වීම.

❖ මෙම ආගම සිය දේශපාලන ආධිපත්‍යයට තර්ජනයක් ලෙස සැලකූ රෝම පාලකයන් එය මර්දනය කිරීමට පෙළඹීම (සෙප්ටිමියස් සෙවරුස්, ඩේසියස්, වැලේරියන්, ඩයක්ලීෂියන්).

❖ ක්‍රිස්තියානිය මර්දනය කිරීම නිෂ්ඵල ක්‍රියාවක් බව පෙනීයාම නිසා රෝම අධිරාජයන් ක්‍රිස්තියානිය පිළිගැනීමට ක්‍රියාකිරීම.

- මුල්දී ක්‍රිස්තියානිය මර්දනය කිරීමට ක්‍රියාකළ ගැලේරියන්, සිය මරණයට පෙරාතුව ක්‍රි.ව. 311 දී ක්‍රිස්තියානින්ට ආගම අදහීමේ නිදහස ලබාදීම.
- ක්‍රි.ව. 312 දී කොන්ස්ටන්ටයින් කිතු දහම වැළඳ ගැනීම.
- තියඩෝසියස්, ක්‍රිස්තියානිය රෝම අධිරාජ්‍යයේ රාජ්‍යාගම බවට පත් කිරීම හා අනෙකුත් ආගම් මර්දනය කරන්නට කටයුතු කිරීම.

*(ලකුණු 08යි)*

**(ii) ප්‍රති රෙපරමාදුව**

❖ ප්‍රොතෙස්තාන්තවාදයට එරෙහිව කතෝලික සභාවෙන් එල්ල වූ ප්‍රතික්‍රියාව ප්‍රති රෙපරමාදුව නමින් හැඳින්වේ.

❖ අරමුණු-ප්‍රොතෙස්තාන්තවාදීන්ගේ ආගමික මතවාද බිඳදැමීම; ප්‍රොතෙස්තාන්තවාදය ව්‍යාප්ත වීම වැළැක්වීම හා කතෝලික සභාවේ බලය යළි පිහිටුවීම.

❖ ප්‍රධාන අංග-ජේසුයිට් නිකාය; ට්‍රෙන්ට් සම්මේලනය; අධර්ම මර්දනාධිකරණය

*(ලකුණු 08යි)*

**(iii) දාහතරවන ලුවී රජතුමා**

❖ මෙම රජු 1643 දී ප්‍රංශ රජ තනතුරට පත් වූ නමුත් මුලදී ප්‍රංශයේ රාජ්‍ය කටයුතු සැබෑ වශයෙන් මෙහෙයවන ලද්දේ මැසරීන් විසින්.

❖ මොහු ප්‍රංශයේ සැබෑ පාලකයා වශයෙන් කටයුතු කරන්නට පටන්ගන්නේ 1661 මැසරින් මියගිය පසුවය.

❖ 1715 තෙක් දාහතරවන ලුවී රාජ්‍ය පාලන කටයුතු මෙහෙයවීය.

❖ යුරෝපයේ එවකට පැවති බලවත්ම රාජ්‍යය වූ ප්‍රංශයේ දැඩි ඒකාධිපති පාලනයක් ගෙනගියේය.

❖ 'රාජ්‍යය යනු මම වෙමි' යන්න ඔහුගේ ප්‍රකාශයකි.

❖ ඔහු රාජත්වයට දේවවරම්වාදී උරුමයක් ආරූඪ කළේය.

❖ බලය රජු වෙත කේන්ද්‍රගත කරන ලද දැඩි මධ්‍යගත ආණ්ඩුවක් හා කාර්යක්ෂම පරිපාලන යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම - ඉන්ටෙන්ඩාන්ට්වරුන්ගේ පරිපාලනය.

❖ ශක්තිමත් හමුදා බලයක් පවත්වාගෙන යාම.

❖ කෝල්බෙයා නම් ඇමතිවරයා යටතේ මූල්‍ය පාලනය ක්‍රමවත් කරවීම හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම.

❖ සංස්කෘතික ප්‍රබෝධයක් පැවතීම.

Academy of Sciences පිහිටුවීම, නාට්‍ය කලාවේ ප්‍රබෝධය හා වර්සායි මාළිගාව.

❖ ස්පාඤ්ඤයට, ඕලන්දයට හා ශුද්ධ රෝම අධිරාජ්‍යයට එරෙහිව සටන් කිරීම.

❖ යාබද ප්‍රදේශ ඈඳාගනිමින් උතුරු ප්‍රංශයේ දේශසීමා පුළුල් කිරීම.

*(ලකුණු 08යි)*

**(iv)** එංගලන්තයේ සිදු වූ උත්කෘෂ්ට විප්ලවය

❖ රජු හා පාර්ලිමේන්තුව අතර බලය සඳහා වූ අරගලය.

❖ ස්ටුවර්ට් වාංශික රජවරුන් රජුගේ බලය වර්ධනය කරගැනීමට පාර්ලිමේන්තුව නොතකාහැර කටයුතු කිරීම.

❖ කතෝලිකයන් වූ ස්ටුවර්ට් රජවරුන් හා රෙපරමාදුභක්තික පාර්ලිමේන්තුවාදීන් අතර ආගමික ප්‍රතිවිරෝධතා ඇතිවීම.

❖ පසුබිම:

- 1642 සිවිල් යුද්ධය
- 1649 පළමුවන චාල්ස් රජුගේ හිස ගසා දැමීම
- දෙවන චාල්ස් රජවීම හා ඔහුගේ අත්තනෝමතික පාලනය
- 1688 විප්ලවය

❖ ප්‍රතිඵල:

- පාර්ලිමේන්තුවේ අයිතිවාසිකම් තහවුරුවීම.
- රජුගේ බලය සීමාවීම.
- 1689 අයිතිවාසිකම් පනත

*(ලකුණු 08යි)*

## C කොටස

**6. (i) නැපෝලියන් බොනපාට් ප්‍රංශය තුළ බලය අත්පත් කරගත් අයුරු පරීක්ෂා කරන්න.**

- ❖ 1769 දී උපත ලැබූ නැපෝලියන් බොනපාට් ප්‍රංශයට පැමිණ පැරීසියේ හමුදා විද්‍යාලයේ ලැබූ අධ්‍යාපනයෙන් පසුව, කාලතුවක්කු හමුදාවේ නිලධාරියෙකු බවට පත්වීම.
- ❖ 1793 දෙසැම්බර් මස ටූලෝං වරායට එල්ල වූ ඉංග්‍රීසි ප්‍රහාරය සාර්ථක ලෙස මැඩ පැවැත්වීම.
- ❖ 1796 ඉතාලිය ආක්‍රමණය කළ ප්‍රංශ හමුදාවේ අණදෙන නිලධාරියා ලෙස පත්වීම.
- ❖ 1798 මිසර ආක්‍රමණය අසාර්ථක වුවත් නැපෝලියන්ගේ ජනප්‍රියත්වය දිගටම පැවතීම.
- ❖ 1799 නොවැම්බර් මස ඔහු, එවකට පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනය පෙරළා දැමීමට හවුල්වීම.
- ❖ 1799 දී පළමුවන කොන්සල්වරයා බවටත් 1802 දී යාවජීව කොන්සල්වරයා බවටත් පත්වීම.
- ❖ 1804 ප්‍රංශ අධිරාජයා ලෙස ඔටුණු පැළඳීම.

*(ලකුණු 05යි)*

**(ii) නැපෝලියන් බොනපාට්ගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය ඇසුරෙන් ඔහුගේ කාර්යසංසිද්ධිය අගය කරන්න.**

- ❖ දේශීය ප්‍රතිපත්තිය

  <u>ආණ්ඩුක්‍රමය:</u>

  - ව්‍යවස්ථාදායක, විධායක හා පරිපාලන බලතල පළමුවන කොන්සල්වරයා (පසුව අධිරාජයා) වෙත සංකේන්ද්‍රගත කරන ලද ඒකාධිපති පාලන ක්‍රමයක් පිහිටුවා ගැනීම.
  - ජනවිචාරණ මගින් සිය ක්‍රියාමාර්ගවලට මහජන අනුමැතිය ලබාගැනීම.
  - පළාත් පාලනය සංකේන්ද්‍රගත කිරීම හා පළාත් පාලන ඒකකවලට මධ්‍යම ආණ්ඩුවෙන් නිලධාරීන් පත් කිරීම.
  - පරිපාලන ඒකාබද්ධතාවක් ඇති කිරීම.
  - දක්ෂතා අනුව තනතුරුවලට පත්වීමේ හා උසස්වීමේ ඉඩ ප්‍රස්තා ලබාදීම.
  - නීතිය ඉදිරියේ සමානාත්මතාව, පුද්ගලික දේපළ හිමිකම, අඩවහල් ක්‍රමය අහෝසි කිරීම, රජයේ ලෞකික ස්වභාවය ආදී විප්ලවයේ අරමුණු හා මූලධර්ම ආරක්ෂා කිරීම හා ඒවාට නීත්‍යානුකූල පදනමක් ලබාදීම.
  - එසේ වුවත් ප්‍රංශ විප්ලවයේ ලිබරල් අරමුණු නොසලකා හැරීම.

අධ්‍යාපනය:

- පාසැල් පද්ධතිය ප්‍රතිසංවිධානය කිරීම.
- විද්‍යා විෂයයන් ඉගැන්වීම දිරිමත් කිරීම හා ඉතිහාසය, දේශපාලන විද්‍යාව වැනි විෂයයන් පාසැල් විෂය මාලාවෙන් ඉවත් කිරීම.
- ප්‍රංශයේ ජාතික විශ්වවිද්‍යාලයක් පිහිටුවීම.

ආර්ථිකය:

- තීරුබදු ආරක්ෂණ ක්‍රියාමාර්ග හා ණය පහසුකම් ලබාදීම මගින් කර්මාන්ත දියුණුවට ආධාර කිරීම.
- මහාමාර්ග හා ඇළ මාර්ග ආදිය තැනීමෙන් වෙළඳාමේ දියුණුවට පහසුකම් සැලසීම.
- බැංකු පිහිටුවීම හා මූල්‍ය ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම.

❖ **විදේශීය ප්‍රතිපත්තිය**

- ප්‍රංශය මුල්කොටගත් අධිරාජ්‍යයක් ගොඩනැංවීම සහ ප්‍රංශ විප්ලවයේ ඇතැම් අරමුණු පතුරුවාලීමේ අදහසින් නැපෝලියන් විදේශ රටවල් ආක්‍රමණය කිරීම.
- ප්‍රංශ බලය ව්‍යාප්ත වීම - ඇතැම් ප්‍රදේශ සෘජු ආධිපත්‍යයට නතු කරගැනීම හා තවත් ප්‍රදේශ ප්‍රංශයට අවනත රාජ්‍ය කරගැනීම.
- මේ ආක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස යුරෝපා දේශපාලන සිතියමේ පුළුල් වෙනසක් ඇති කිරීම - ඉතාලිය, ජර්මනිය.
- නැපෝලියන්ගේ ව්‍යාප්තවාදී ප්‍රතිපත්තිය හේතුකොටගෙන සෙසු යුරෝපා බලවතුන් බොහොමයක් ප්‍රංශ විරෝධී යුධ සන්ධාන ඇතිකරගෙන ප්‍රංශයට එරෙහිව සටන් කිරීම.
- එංගලන්තය ආර්ථික වශයෙන් දුර්වල කරගැනීම අරමුණු කරගෙන 'මහද්වීපික ක්‍රමය' ක්‍රියාත්මක කිරීම.
- අවසාන ප්‍රංශ විරෝධී යුධ සන්ධානයේ ප්‍රහාර හමුවේ නැපෝලියන් පරාජයට පත්වීම.

*(ලකුණු 11යි)*

7. "ජර්මනිය එක්සත් කිරීම ප්‍රශියාවේ කාර්යයක් විය."

**(i) ප්‍රශියාවේ නායකත්වය යටතේ පිහිටුවන ලද තීරුබදු සංගමය නම් කරන්න.**

සොල්වරයින්

*(ලකුණු 01යි)*

**(ii) 1848 ට පෙර ජර්මනිය එක්සත් කිරීමට එරෙහිව පැවති බාධක දෙකක් සඳහන් කරන්න.**

- ❖ රාජ්‍ය කොටස් 39 කට බෙදී පැවතීම.
- ❖ ඔස්ට්‍රියානු බලය හා බලපෑම.
- ❖ මෙටර්නික් ක්‍රමය.
- ❖ වියනා සම්මේලනයේ තීරණ ක්‍රියාත්මක කිරීමට යුරෝපා රටවල් බැඳී සිටීම.
- ❖ එක්සත්භාවය පිළිබඳ ජාතිකවාදී සංකල්පය ප්‍රමාණවත් ලෙස ප්‍රචලිතව නොතිබීම.
- ❖ ජර්මනිය එක්සේසත් කිරීම සඳහා තනි වැඩපිළිවෙලක් වෙනුවට විවිධ ක්‍රියාමාර්ග ඉදිරිපත්වීම.

*(ලකුණු 02යි)*

**(iii) බිස්මාර්ක් ප්‍රශියාවේ චාන්සලර් තනතුරට පත් වූ ආකාරය සැකෙවින් දක්වන්න.**

- ❖ ජර්මනිය එක්සත් කිරීමේ ප්‍රධාන නියමුවා වූ ඔටෝ ෆොන් බිස්මාක් 1815 දී ප්‍රශියාවේ ඉඩම් හිමි ජුන්කර් රදළ පැලැන්තියේ පවුලක උපත ලැබීය.
- ❖ 1847 දී පමණ ප්‍රශියානු ඩයට් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් වූ ඔහු දැඩි කොන්සර්වේටිව්වාදියෙකු විය. 1848-49 විප්ලව සමයේ විප්ලවවාදීන්ට දැඩි ලෙස විරුද්ධ වූ බිස්මාක් රාජාණ්ඩුව ආරක්ෂා කිරීමට ප්‍රශියාව තුළ කැපවී ක්‍රියා කළේය.
- ❖ 1859-62 කාලය තුළ රුසියාවේ සහ ප්‍රංශයේ ප්‍රශියානු තානාපතිවරයා වශයෙන් කටයුතු කළේය.
- ❖ 1862 වසරේ ප්‍රශියානු පාර්ලිමේන්තුව තුළ ලිබරල්වාදීන් සහ රජු අතර ගැටුම් ඇති වූ අවස්ථාවේදී එය නිරාකරණය කිරීමට ප්‍රශියාවේ චාන්සලර්වරයා ලෙස පත් කෙරිණි.

*(ලකුණු 02 යි)*

**(ii) එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා කෙරෙහි අවධානය යොමු කරමින් ජර්මනිය එක්සත් කිරීම ප්‍රශියාවේ කාර්යයක් ලෙස කෙතෙක් දුරට සැලකිය හැකිදැයි විමසන්න.**

- ❖ 1834 ප්‍රශියාවේ මූලිකත්වයෙන් පිහිටුවන ලද සොල්වරයින් තීරුබදු සංගමය මගින් ජර්මන් රාජ්‍ය අතර ආර්ථික එකමුතු බවක් ඇති කිරීම.
- ❖ එමගින් දේශපාලන එක්සත්භාවයකට මග පෑදීම.
- ❖ 1862 බිස්මාක් ප්‍රශියාවේ චාන්සලර් තනතුරට පත්වීම. ඔහු ප්‍රශියාවේ නායකත්වය යටතේ ප්‍රශියානු බලය ජර්මනිය පුරා ව්‍යාප්ත කොට ජර්මනිය එක්සත් කිරීමට අධිෂ්ඨාන කරගෙන සිටීම.

❖ ප්‍රශියානු හමුදාව ශක්තිමත් කිරීම.

1864: ෂ්ලෙස්විග් හා හොල්ස්ටයින් මුල්කරගෙන ඔස්ට්‍රියාව ප්‍රශියාව විසින් ඩෙන්මාර්කය පරාජය කරනු ලැබීය.

1866: ඔස්ට්‍රියාව හා ප්‍රශියාව අතර ඇති වූ සත් සති යුද්ධය; ප්‍රශියාව ජර්මනියේ ප්‍රමුඛ හා ශක්තිමත්ම බලවේගය ලෙස ඉස්මතු වීම; ප්‍රශියානු නායකත්වය යටතේ උතුරු ජර්මන් සංයුක්තය පිහිටුවීම.

1870-71: ප්‍රංශ-ප්‍රශියානු යුද්ධය; දකුණු ජර්මන් රාජ්‍ය උතුරු ජර්මන් සංයුක්තියට ඈඳා ගැනීම.

ඉහත සඳහන් අවස්ථා හා සිදුවීම් විග්‍රහ කරමින් ජර්මනිය එක්සත් කිරීමෙහිලා ප්‍රශියාව විසින් ඉටු කරන ලද භූමිකාව පරීක්ෂා කළ යුතුය.

*(ලකුණු 11යි)*

8. දෙවන ලෝක යුද්ධයෙන් උද්ගත වූ ප්‍රධාන ප්‍රතිඵල විග්‍රහ කරන්න.

❖ මිත්‍ර ජාතීන් ඉතාලිය හා ජර්මනිය පරාජයට පත්කොට, හිරෝෂිමා සහ නාගසාකි වෙත පරමාණු බෝම්බ හෙළීමෙන් පසු ජපානය කොන්දේසි විරහිතව යටත්වීමත් සමග දෙවන ලෝක යුද්ධය අවසන් විය.

❖ පළමුවන ලෝක යුද්ධය අවසන අත්සන් කළ වර්සායි සම්මුතිය බඳු සාම සම්මුතියක් මෙම යුද්ධයෙන් පසුව ඇති නොවීය.

❖ මිනිස් ඉතිහාසයේ මෙතෙක් ඇති වූ අතිශයින්ම විනාශකාරී යුද්ධයයි - මියගිය සංඛ්‍යාව මිලියන 30 කට අධිකය (මේ අතරින් අඩකටත් වැඩි ප්‍රමාණයක් රුසියානුවන්ය); විනාශ වූ භෞතික සම්පත් ප්‍රමාණය හා වටිනාකම ගණනය කළ නොහැකි තරම්ය; න්‍යෂ්ටික බෝම්බයෙන් හිරොෂිමා හා නාගසාකි නගර විනාශවීම.

❖ ලෝක බලසැකැස්ම වෙනස්වීම - ලෝකයේ යුරෝපා ආධිපත්‍යය අවසන් වීම.

❖ අමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය ලොව බලවත්ම බලවතුන් ලෙස නැගී ඒම හා ලෝකය බලකඳවුරු දෙකකට බෙදීයාම.

❖ බටහිර යුරෝපා රටවල් එක්සත්භාවයක් කරා යොමුවීම.

❖ යුරෝපා රටවල් පවත්වාගෙන ගිය විදේශ අධිරාජ්‍යයන් බිඳවැටීමට මඟපෑදීම හා ආසියා-අප්‍රිකා රාජ්‍ය නිදහස ලබාගැනීම.

❖ ලෝක සාමය ආරක්ෂා කරගැනීමේ අරමුණෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම.

*(ලකුණු 16යි)*

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ජර්මනියේ නට්සිවාදය

(ii) ජෝශප් ස්ටාලින්

(iii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු හා ව්‍යුහය

(iv) නිරවි යුද්ධය

(i) ජර්මනියේ නට්සිවාදය

❖ පලමුවන ලෝක යුද්ධය අවසන්වීමෙන් වික කලකට පසුව ඇඩොල්ෆ් හිට්ලර් යටතේ ජර්මනියේ ඇති වූ සර්වාධිපති දෘෂ්ටිය හා පාලන ක්‍රමය නට්සිවාදය නමින් හඳුන්වනු ලබයි.

❖ වර්සායි ගිවිසුමෙන් ජර්මනිය වෙත පනවන ලද ඉතා දැඩි කොන්දේසි, වයිමාර් සමූහාණ්ඩුවේ අසාර්ථකත්වය හා ජර්මනිය මුහුණදුන් දරුණු ආර්ථික අර්බුදය ජර්මනිය තුළ නට්සිවාදය නැගී ඒමට ප්‍රධාන වශයෙන් හේතු විය.

❖ නට්සිවාදී පාලනයේ ප්‍රධාන ලක්ෂණ:

- පාලකයා (හිට්ලර්) පූර්ණ ඒකාධිපතියෙකු වීම.
- ජාතික සමාජවාදී පක්ෂය හැර අනෙකුත් සියලු පක්ෂ තහනම් කිරීම.
- පාර්ලිමේන්තු සභාවල බලය අහෝසි කිරීම.
- යුදෙව්වන් 'රජයේ සතුරන්' වශයෙන් සැලකුවෙන් තනතුරුවලින් නෙරපාදැමීම.
- වෘත්තිය සමිති තහනම් කිරීම.
- අධ්‍යාපන ක්‍රමය, නට්සිවාදයේ දැඩි බලපෑමට ලක්කිරීම.
- සන්නිවේදන මාධ්‍ය රජය විසින් දැඩි පාලනයකට යටත් කිරීම.
- ආර්ථිකය රජය මගින් පාලනය වීම.
- ආගම රජයේ පාලනය යටතට පත් කිරීම.
- අන්තවාදී ජාතිවාදය - යුදෙව් විරෝධය හා යුදෙව්වන් සහ වෙනත් දේශපාලන සිරකරුවන් ඝාතනය කිරීම.
- ජර්මනිය පොලිස් රාජ්‍යයක් බවට පත් කිරීම.

❖ හිට්ලර්ගේ දේශීය හා විදේශ ප්‍රතිපත්ති දෙවන ලෝක යුද්ධය ඇතිවීමට බලපෑම.

*(ලකුණු 08යි)*

**(ii) ජෝශප් ස්ටාලින්**

❖ 1879 ජෝර්ජියාවේ උපත ලැබ, 1904 දී බොල්ෂෙවික් පක්ෂයට බැඳුන ජෝශප් ස්ටාලින් 1917 බොල්ෂෙවික් විප්ලවටය් නායකයෙකු වශයෙන් කටයුතු කළේය.

❖ 1929 ලෙනින්ගේ මරණින් පසු කොමියුනිස්ට් පක්ෂයේ මහලේකම් පදවියට පත්වීම.

❖ සෝවියට් දේශයේ නායකත්වය සඳහා ට්‍රොට්ස්කි සමග තරගයක් ඇතිකර ගැනීම (ස්ටාලින්ගේ 'තනි රටේ සමාජවාදය' හා ට්‍රොට්ස්කිගේ 'නොනවතින විප්ලවය' පිළිබඳ සංකල්ප පරස්පර වීමහා 1929 දී ස්ටාලින් බලයට පත්වීම.

❖ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් සියලුදෙනාම පක්ෂයෙන් නෙරපා දැමීම.

❖ සෝවියට් දේශය තුළ කර්මාන්ත දියුණුවක් ඇතිකිරීමට පසු අවුරුදු සැලසුම් ක්‍රියාත්මක කිරීම හා ඒවායින් සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම.

❖ කෘෂිකර්මාන්තය දියුණුකිරීම සඳහා සමූහ ගොවිපලවල් ඇරඹීම. එයින් සාර්තක ප්‍රථිඵල අත්වුවත්, ගොවි ජනතාව අතිවිශාල පීඩාවන්ට මුහුණදීම.

❖ සෝවියට් දේශය තුළ දැඩි ඒකාධිපති පාලනයක් ක්‍රියාත්මක කිරීම.

❖ දෙවන ලෝක යුධ සමයේදී මිත්‍ර ජාතීන් සමග එකතු වී, ෆැසිස්ට්වාදයට එරෙහිව සටන් කිරීම.

❖ කොමියුනිස්ට්වාදය ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම හා ඊට සමාන්තරව නිරවි යුද්ධය උත්සන්න වීම.

❖ 1953 දී මියයාම.

*(ලකුණු 08යි)*

**(iii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු හා ව්‍යුහය**

❖ අරමුණුඃ

- ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම.
- ජාතීන් අතර මිත්‍රත්වය වර්ධනය කිරීම.
- ආර්ථික-සමාජ-සංස්කෘතික සහ මානුෂික ප්‍රවේශයකින් ප්‍රශ්න විසඳීම.
- මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් තහවුරු කිරීමෙහිලා ජාත්‍යන්තර සහයෝගය ලබාගැනීම.
- මෙම පොදු අරමුණු සපුරාගැනීම සඳහා ලෝක කේන්ද්‍රයක් ලෙස කටයුතු කිරීම.

❖ ව්‍යුහයඃ

ප්‍රධාන ආයතන 6 කි

1) මහ සභාව

2) ආරක්ෂක මණ්ඩලය

3) ආර්ථික හා සමාජ මණ්ඩලය

4) භාරකාරත්ව මණ්ඩලය

5) මහ ලේකම් කාර්යාලය

6) ජාත්‍යන්තර අධිකරණය

*(ලකුණු 08යි)*

**(iv)** නිරවි යුද්ධය

♦ දෙවන ලෝක යුද්ධය අවසන්වීමත් සමග මහාජාතීන් අතර පැවති මිත්‍රත්වය බිඳවැටී ඔවුන් වටා රොක් වූ බලකඳවුරු දෙකක් බිහිවිය:

1. අමෙරිකා එක්සත් ජනපදය ප්‍රධාන ධනවාදී, ප්‍රජාතන්ත්‍රවාදී රටවල්

2. සෝවියට් රුසියාව ප්‍රධාන සමාජවාදී, කොමියුනිස්ට් රටවල්

♦ කඳවුරු අතර අවිශ්වාසය වර්ධනය වීම.

- සෝවියට් ආණ්ඩුව විසින් අත්පත් කරගත් ප්‍රදේශවල කොමියුනිස්ට් ආණ්ඩු පිහිටුවීම.
- අමෙරිකාව සතුව පරමාණු බෝම්බයක් තිබීම.
- කඳවුරු දෙක අතර දේශපාලන මතවාදීමය වශයෙන් ප්‍රතිවිරෝධතා පැවතීම.
- 1947 මාර්තු ප්‍රකාශයට පත් කෙරුණ ට්‍රෲමන් න්‍යාය - නිදහස් රටවල ආරක්ෂාවටත්, ඒවාට එරෙහි බලවේගවලට විරුද්ධවත් අමෙරිකා එක්සත් ජනපදය ආධාර කරන බවට දුන් පොරොන්දුව; ඒ අනුව ග්‍රීසියේ කොමියුනිස්ට් නැඟීසිටීම මර්දනය කිරීමට මැදිහත්වීම.
- මාෂල් සැලැස්ම මගින් යුරෝපය යළි ගොඩනැංවීමට ආධාර කිරීම මගින් කොමියුනිස්ට් ව්‍යාප්තිය සීමා කිරීමට උත්සාහ කිරීම.
- 1949 දී නේටෝ (NATO) සංවිධානය පිහිටුවීම.
- ඊට ප්‍රතිචාර වශයෙන් සෝවියට් කඳවුර 1955 දී වෝර්සෝ (WARSAW) කඳවුර පිහිටුවීම.

♦ ඍජුවම යුද්ධයකට සහභාගී නොවී එකිනෙක කඳවුරු අතර සිදුවූ අරගලයක් වීම.

♦ එම ගැටුම ආරක්ෂාව, ආර්ථිකය, දේශපාලනය, රාජ්‍යාන්තර සම්බන්ධතා, සංස්කෘතික සම්බන්ධතා, අවි නිශ්පාදනය, චන්ද්‍රිකා තාක්ෂණය ආදී සෑම ක්ෂෙත්‍රයකටම ව්‍යාප්තව යාම.

♦ මහජාතීන් අතර යුද්ධයක් ඇති නොවුණද ලොව විවිධ ප්‍රදේශවල ඇති වූ ගැටුම්වලට මෙම තත්ත්වය බලපෑම.

- බර්ලින් අර්බුදය 1948-1958
- කොරියන් යුද්ධය 1950

- හංගේරියානු අර්බුදය 1956
- චෙකොස්ලෝවෙකියාව ආක්‍රමණය
- කියුබානු මිසයිල අර්බුදය
- වියට්නාම් අර්බුදය

♦ 1985 මිහායිල් ගොර්බචොෆ් සෝවියට් රුසියාවේ ජනාධිපති බවට පත්වීමෙන් අනතුරුව කඳවුරු දෙක අතර මතභේද සමනය වන්නට පටන්ගැනීම හා ක්‍රමයෙන් තුෂ්ණි යුද තත්ත්වය තුනී වී යාම.

- සෝවියට් රුසියානු සමූහාණ්ඩුව බිඳවැටීම.
- යුරෝපයේ කොමියුනිස්ට් රටවල් සෝවියට් ග්‍රහණයෙන් නිදහස් වීම.
- වොර්සෝ ගිවිසුම් සංවිධානය අවසන් වීම.

*(ලකුණු 08යි)*

★★★★★★